## දෘශ්‍ය කලා පීඨය සඳහා සිසුන් බඳවා ගැනීමේ අභියෝග්‍යතා පරීක්ෂණය

උක්ත පරීක්ෂණයේ දී අපේක්ෂක අපේක්ෂිකාවන්ට ලකුණු ලැබෙනු ඇත්තේ පරීක්ෂණ මණ්ඩල 04 කින් දෙනු ලබන ලකුණුවල එකතුවක් හැටියටය. එක් එක් මණ්ඩලයේ පරීක්ෂකවරුන් විසින් තනි තනිව සිය ස්වාධීන ලකුණු ලැයිස්තුව බැගින් ලබාදිය යුතුය. ඒ සඳහා විශ්වවිද්‍යාල අභ්‍යන්තරයෙන් මෙන්ම බාහිර ප්‍රවීණයන්ගෙන්ද පරීක්ෂණ මණ්ඩල සමන්විත වේ. පරීක්ෂණ මණ්ඩලය සාමූහිකව කථා කොට ලකුණු ලබාදීම සපුරා තහනම් වේ. එසේ තනි තනිව ලකුණු දෙන පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව 20ක් හෝ ඊට වැඩිය. විනිවිධභාවය සහතික කිරීම, බලපෑම් කිරීමට ඇති අවකාශය ඉවත් කිරීම හා අපේක්ෂක අපේක්ෂිකාවන්ට ඉහළම සාධාරණයක් ඉෂ්ඨ කිරීම පිණිස මෙම ක්‍රමවේදය විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරනු ලැබේ.

### (1) පළමු පරීක්ෂණය

(ඇඳීම I)

නියමිත කාලය තුළදී අභ්‍යාස දෙකක් (02) කළ යුතුය. පළමු වැන්න කඩදාසියේ එක් කොටසක පැන්සල් හෝ චාකෝල් මාධ්‍යය හෝ භාවිතයෙන් මානව රූපයක් ඇඳීම. දෙවන අභ්‍යාසය කඩදාසියේ අනෙක් කොටසේ දිය සායම් මාධ්‍යයෙන් මානව රූපය පින්තාරු කිරීම.

**ඇගයීම**

- i මානව රූපය රේඛාමය ශක්තියකින් ග්‍රහණය කිරීම
- ii මානව රූපය ත්‍රිමාන ගුණයකින් යුක්තව ග්‍රහණය කිරීමේ කුසලතාවය
- iii ලබා දී ඇති කඩදාසිය මත අදාළ මානව රූපය නිසි ලෙස සංරචනය කර ගැනීම පිළිබඳ මෙහිදී නිරීක්ෂණය කරනු ලැබේ.
  (මෙම පරීක්ෂණයේ දී මානව රූපය ඇඳීමක දී දක්වනු ලබන සංවේදීතාවය පළමුව නිරීක්ෂණය කරනු ලබන අතර දෙවන අභ්‍යාසය වර්ණ භාවිතාව පිළිබඳව නිරීක්ෂණය කරනු ලැබේ.)
  (*කාලය පැය 03, පළමු අභ්‍යාසය සඳහා ලකුණු 20 යි, දෙවන අභ්‍යාසය සඳහා ලකුණු 20යි, එකතුව 40*)

### (2) දෙවන පරීක්ෂණය

(ඇඳීම II)

නියමිත කාලයේ දී අභ්‍යාස තුනක් (03) කළ යුතුය.

- i පරීක්ෂණයේ දී දෙනු ලබන ද්‍රව්‍ය, උපකරණ, වස්තූන්, ඇඳීමේ මාධ්‍යයකින් ග්‍රහණය කරන අයුරු නිරීක්ෂණය කිරීම මෙහිදී සිදු වේ. කඩදාසියේ එක් පසෙක පැන්සල් හෝ චාකෝල් මාධ්‍යය හෝ භාවිතයෙන් මෙම අභ්‍යාසය කළ යුතුය.

- ii දෙවෙනි අභ්‍යාසය ලෙස එම ද්‍රව්‍ය, උපකරණ, වස්තූන් වෙනත් ආකාරයකට නිරීක්ෂණය කරගනිමින් තමන් කැමති ආකාරයට කරනු ලබන ස්වීය සංරචනයක් හෝ ඒ ඇසුරින් කරනු ලබන මෝස්තර නිර්මාණයක් හෝ අනෙක් කොටසේ වර්ණ වලින් කළ යුතුය. මෙයින් ව්‍යාවහාරික කලා සඳහා ශිෂ්‍යයා දක්වන බහුවිධ කුසලතා වෙන වෙනම හඳුනා ගැනීම සහ නිරීක්ෂණය කිරීම සිදු වේ.

- iii තමන් විසින් කරන ලද ස්වීය සංරචනය හෝ මෝස්තර නිර්මාණය හෝ පිළිබඳව අපේක්ෂකයා විසින් සිය අදහස් දෙනු ලබන පත්‍රිකාවක අවම වශයෙන් වචන 150 කින් ලියා ඉදිරිපත් කළ යුතුය. එය අඳින ලද කඩදාසියට ඇමිනිය යුතු වේ. මෙයින් අපේක්ෂකයාගේ ලිවීමේ කෞශල්‍යය ඇගයීමකට ලක් කරනු ඇත.
  (*කාලය පැය 04, පළමු අභ්‍යාසය සඳහා ලකුණු 15 යි, දෙවන අභ්‍යාසය සඳහා ලකුණු 15 යි, තෙවෙනි අභ්‍යාසය සඳහා ලකුණු 10 යි, එකතුව 40 යි.*)

## (3) තෙවන පරීක්ෂණය

(වාචික)

i වාචික පරීක්ෂණයේ දී සමාජ සංස්කෘතික පරිසරය පිළිබඳ අපේක්ෂකයාගේ අවබෝධය විමසීම.

ii කලාව පිළිබඳ අපේක්ෂකයාගේ ආකල්ප විමසීම.

iii අපේක්ෂකයාගේ අභිලාෂ හා බලාපොරොත්තු විමසීම.

ඉහත කරුණු මුල්කරගෙන දෘශ්‍ය කලාව පිළිබඳ සාමාන්‍ය දැනීම ඇගැයීම පිණිස අසනු ලබන කෙටි ප්‍රශ්න වලින් අපේක්ෂකයන් සතු අදහස් ප්‍රකාශ කිරීමේ කුසලතාවය නිරීක්ෂණය කරනු ලැබේ. වාචික පරීක්ෂණය සඳහා එක් අයෙකුට උපරිම කාලය මිනිත්තු 10 කි. ලබාදිය යුතු උපරිම ලකුණු ප්‍රමාණය 10 කි.

## (4) සිව්වන පරීක්ෂණය

කැඳවනු ලබන අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් ඔවුන්ගේ කුසලතා ප්‍රදර්ශනය කිරීම සඳහා ඔවුන් විසින් දිනා ඇති විවිධ සහතික, පදක්කම් හා ප්‍රසංග සඳහා ලැබී ඇති ප්‍රශංසනාත්මක ලිපි සමග තමන් විසින් ඉදිරිපත් කර ඇති ප්‍රසංග වල ඡායාරූප 10 කින් යුත් ගොනුවක් (Portfolio) සම්මුඛ පරීක්ෂණය සඳහා රැගෙන ආ යුතුය.

දේශීය මට්ටමේ හැකියාවන් සඳහා ප්‍රථම ස්ථානයකට එක් ලකුණක් ද ඉතිරි ස්ථාන සඳහා දශමස්ථාන වලින් ලකුණු එකතු වන ආකාරයට ද ජාත්‍යන්තර මට්ටමේ දිනා ඇති පදක්කම් හෝ සහතිකපත් සඳහා ප්‍රථම ස්ථානයකට ලකුණු දෙකක් ද වශයෙන් අනෙකුත් ස්ථාන සඳහා දශමස්ථාන වලින් ලකුණු එකතු වන ආකාරයට උපරිම ලකුණු 10 ක් සිව්වන පරීක්ෂණයේ දී ප්‍රදානය කෙරේ.

උදාහරණ ලෙස, ලකුණු ලබාදීම සඳහා සළකා බලන ඉසව් පහත දක්වා ඇත.

**ජාතික තලය**

කොළඹ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන චිත්‍ර කලා තුන් අවුරුදු පාඨමාලාව, ජනකලා කේන්ද්‍රය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පාඨමාලාව, රජයේ පිළිගත් අධ්‍යාපන අමාත්‍යාංශය, සංස්කෘතික අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය වැනි ආයතන මගින් පවත්වනු ලබන අවුරුද්දකට නොඅඩු චිත්‍ර/මූර්ති පාඨමාලා

**ඒක පුද්ගල ඉදිරිපත් කිරීම් ජාතික තලය**
ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය, තෙවන ස්ථානය

**කණ්ඩායම් ලෙස ඉදිරිපත් කිරීම ජාතික තලය**
ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය, තෙවන ස්ථානය

**ජාත්‍යන්තර තලය**

**ඒකපුද්ගල ඉදිරිපත් කිරීම් ජාත්‍යන්තර තලය**
රන් පදක්කම/ප්‍රථම ස්ථානය, රිදී පදක්කම/ දෙවන ස්ථානය, ලෝකඩ පදක්කම/තෙවන ස්ථානය, සහභාගීත්වය

**කණ්ඩායම් මට්ටමින් ඉදිරිපත් කිරීම් ජාත්‍යන්තර තලය**
රන් පදක්කම/ප්‍රථම ස්ථානය, රිදී පදක්කම/ දෙවන ස්ථානය, ලෝකඩ පදක්කම/තෙවන ස්ථානය, සහභාගීත්වය

*කුසලතා ඇගයීමේ දී අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි වර්ෂයට පෙර වර්ෂ 3කට අදාළ සහ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි වර්ෂයට පසු වර්ෂයකට අදාළ කුසලතා සහතික පමණක් සළකා බලනු ලැබේ.*

## (5) අභියෝග්‍යතා පරීක්ෂණයේ පරීක්ෂණ මණ්ඩල සංයුතිය

එක් එක් පරීක්ෂණ මණ්ඩල සඳහා වෙන වෙනම කණ්ඩායම් ඇතුළත් වේ. අංශප්‍රධාන හැර වෙනත් අයට මණ්ඩල දෙකක් නියෝජනය කළ නොහැකිය.

එක් අපේක්ෂකයකුට පරීක්ෂණ මණ්ඩල 04 සඳහා දිනකට මුහුණ දීමට ගතවන කාලය අනුව දිනකට කැඳවන අපේක්ෂක/අපේක්ෂිකාවන් ප්‍රමාණය පීඨය විසින් තීරණය කළ යුතුය.

**පළමු පරීක්ෂණ මණ්ඩලය (ප්‍රායෝගික)**

i අදාළ සියලු අධ්‍යයනාංශ වලින් එහි අංශ ප්‍රධාන හෝ නියෝජිතයෙකු බැගින්
ii බාහිර විෂය ප්‍රවීණයන් දෙදෙනෙක් - 02
iii වෙනත් අධ්‍යයනාංශයක නියෝජිතයන් එක් අයෙකු- 01

**දෙවන පරීක්ෂණ මණ්ඩලය**

i අදාළ අධ්‍යයනාංශ නියෝජිතයන් තිදෙනෙක් - 03
ii බාහිර විෂය ප්‍රවීණයන් දෙදෙනෙක් -02
iii වෙනත් අධ්‍යයනාංශයක නියෝජිතයන් දෙදෙනෙක් -02
iv දෙවන පරීක්ෂණයේ දී අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් සම්පූර්ණ කළයුතු ලිඛිත පත්‍රිකාව පරීක්ෂා කිරීම සඳහා කලා ඉතිහාසය අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධානීවරයා හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු, පීඨ මණ්ඩල බාහිර සාමාජිකයකු හෝ වෙනත් විශ්වවිද්‍යාලයකින් තෝරාගත් පරීක්ෂකවරයෙකු යන අයගෙන් තිදෙනෙක් - 03

**තෙවන පරීක්ෂණ මණ්ඩලය (වාචික)**

i පීඨ මණ්ඩලය නියෝජනය කරන බාහිර මහාචාර්යවරුන් දෙදෙනෙක් - 02
ii එක් එක් අධ්‍යයනාංශයේ ආචාර්යවරුන් අතරින් දෙදෙනෙකු - 02

**සිව්වන පරීක්ෂණ මණ්ඩලය (සහතික පරීක්ෂාව)**
ලේඛකාධිකාරී හෝ ඔහු විසින් නම් කරනු ලබන පරිපාලන නිලධාරීවරයෙකු, පීඨයේ සහකාර ලේඛකාධිකාරී හා අධ්‍යයන හා ශිෂ්‍ය සේවා අංශයේ සහකාර ලේඛකාධිකාරී හෝ නියෝජිතයකු

සම්පූර්ණ පරීක්ෂණ මණ්ඩල සාමාජිකත්වය 20කි. මෙම පරීක්ෂණ මණ්ඩලවලට ඒ ඒ පීඨයන් නියෝජනය කරන බාහිර මහාචාර්යවරුන් හෝ ඒ හා සමාන්තර විෂය ප්‍රවීණයන් ඇතුලත් විය යුතුය. පරීක්ෂක මණ්ඩල සංයුතිය සඳහා පීඨ මණ්ඩලයේ හා සනාතන සභාවේ අනුමැතිය ලබාගෙන තිබිය යුතුය. අපේක්ෂකයකු/අපේක්ෂිකාවක විසින් ඉහත දක්වා ඇති සියලු පරීක්ෂණ වලින් ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණයේ එකතුව ලකුණු 50 කි.

ඉහත නිර්ණායක සහ ක්‍රමවේදය 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සරත් චන්ද්‍රජීව**
**උපකුලපති**

පිටපත - පීඨාධිපති/දෘශ්‍ය කලා පීඨය
සහකාර ලේඛකාධිකාරී/දෘශ්‍ය කලා පීඨය